දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 25 /2012

මගේ අංක:-සැසේ/02/විවිධ/2012,
සැපයුම් හා සේවා අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
2012.10.05 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරී වරුන්,
සහකාර අධිකාරී වරුන් වෙත.

**<u>බන්ධනාගාර කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම.</u>**

කෘෂිකාර්මික සහ අත්තිකාරම් ගිණුම යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තු කර්මාන්ත අංශය සඳහා මුදල් යොදවා, නිෂ්පාදන කාර්යයන් සිදුකලද, බන්ධනාගාර දෙපාර්තමේන්තුව එයින් උපරිම ප්‍රතිඵල නෙලා ගන්නා බවක් නොපෙනේ. විශේෂයෙන් දෙපාර්තමේන්තුව සතුව විශාල ශ්‍රම සම්පතක් තිබියදී එයින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමක් සිදු නොවන අවස්ථා මා වෙත වාර්තාවී ඇත. උදාහරණ වශයෙන් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ලීබඩු උපකරණ පවා පිටතින් මිලදී ගැනීම නිරන්තරයෙන් සිදුවනු ලැබේ.

එම තත්වය එක් අතකින් කර්මාන්ත වලින් දෙපාර්තමේන්තුවට ලබාගත හැකි ආදායම අඩු වනවා මෙන්ම අනික් අතින් රැඳවියන් පුනරුත්ථාපනය කොට වෘත්තීය හැකියාවන් වර්ධනය කිරීමට තිබෙන අවස්ථාද මග හැරී යයි.

මෙම අසතුටුදායක තත්වය ඉතා කඩිනමින් වෙනස්කල යුතුව ඇත. එම නිසා ඉදිරියේදී සියළුම බන්ධනාගාර ආයතන සහ සිරකරුවන් සඳහා අවශ්‍ය වන ලී බඩු සහ අනෙකුත් සියළුම උපකරණ , බන්ධනාගාර කර්මාන්ත අංශය මගින් නිෂ්පාදනය කල යුතු අතර ,එසේ නිෂ්පාදනය කල හැකි කිසිදු භාණ්ඩයක් හෝ උපකරණයක් පිටතින් මිලදී නොගත යුතු බවද , එම භාණ්ඩ හා උපකරණ ,බන්ධනාගාර කර්මාන්ත අංශය මගින් නිෂ්පාදනය කර සැපයීමට කටයුතු කරන ලෙසද මෙයින් දන්වමි .

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

**පී.ඩබ්ලිව්. කොඩිප්පිලි**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**